# ස්ත්‍රී පුරුෂ සමාජභාවය.....
# ජල අයිතිය බල ගැන්වීම
# Gender.....
# Empowering water rights





පොදු නීතියේ ඇති සමානාත්මතා කොන්දේසිවලට හා ප්‍රතිපත්තිවලට අනුකූලනොවීමෙන් හා ඉඩම් සංවර්ධන ආඥා පනතේ ඇති අසාධාරණ නියමයන් හේතුවෙන් කෘෂිකාර්මික ඉඩම්වලට කාන්තාවන්ගේ අයිතිය වලකා ඇති අතර මෙමගින් ජලය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමේ අවස්ථාව මගහැරී ඇත.

Non adherence to the equality provisions in the common law and the discriminatory provisions in the Land Development Ordinance limit  women's access to productive use of water by preventing their access to agricultural land.



දේශගුණික වෙනස්වීම්වලට සම්බන්ධ ස්වාභාවික ආපදාවන් විශේෂයෙන් ගංවතුර හා නායයාම් කාන්තාවන්ට බලපෑම් ඇති කරන්නේ පුරුෂ පක්ෂයට වඩා වෙනස් අන්දමිනි. එම නිසා එම තත්ත්වයට අනුගතවීමේ ප්‍රයත්නවලදී ජලය හා ආහාර සුරක්ෂිතතාව වැඩි කිරීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවයට විශේෂිත වූ බලපෑම් සැලකිල්ලට ගත යුතුවේ.

Women are disproportionately affected by climate change related natural disasters , especially floods and landslides ;adaptation efforts should therefore address gender specific impacts of climate change for enhanced water and food security.





ධීවර අංශයේ හා වතුකරයේ පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවීමෙන් කාන්තාවන්ගේ පෞද්ගලිකත්වයට බවට හා ආරක්ෂාවට බලපාන අතරම ජලාශ්‍රිත රෝග වැඩිවීම ඔවුන්ගේ පවුලේ ආර්ථික දායකත්වයටද බලපායි.

Lack of adequate sanitation facilities especially among the fishing and estate sector families affects women's privacy and security while increase of water related  diseases impacts on their contribution to the family income.





ජලය හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවීම අභ්‍යන්තරව අවතැන්වූ කාන්තාවන්ගේ සත්කාර කිරීමේ ක්‍රියාවලියට බාදා පමුණුවයි. ඔවුන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගෙන නොමැති අතර ඔවුන්ගේ ශක්තීන් නැවත ගොඩනැගීමේ හා පුනරුත්ථාපන ක්‍රියාවලියට දායක කර නොගැනීමෙන් ඔවුන්ගේ පීඩිතභාවය තවදුරටත් තහවුරු කර ඇත.

Inadequacy of water and sanitation facilities affects the care giving role of female Internally Displaced Persons (IDPs); their needs are not addressed nor are their strengths utilized in the reconstruction and rehabilitation process which reinforces their subservience.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සැළසුම් කිරීම කාන්තාවන්ගේ දැනීම හා විශේෂඥතාව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතා විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම තුළින් කාන්තාවන්ට ජල සම්පත් ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කෙරේ.

Gender sensitive planning, harnessing women's knowledge and expertise and implementing gender equality provisions affirm equal access to water resources.

GWA GENDER AND WATER ALLIANCE

IW LEARN

CEE Centre for Environment Education